WWW.OLEVELAPI.COM

සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது /All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka
14 S I, II

අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය, 2024(2025)
கல்விப் பொதுத் தராதரப் பத்திர (சாதாரண தர)ப் பரீட்சை, 2024(2025)
General Certificate of Education (Ord. Level) Examination, 2024(2025)

කතෝලික ධර්මය I, II
கத்தோலிக்கத் திருமறை I, II
Catholicism I, II

කතෝලික ධර්මය II

* **පළමුවන** ප්‍රශ්නය හා තෝරාගත් තවත් ප්‍රශ්න **හතරක්** ඇතුළුව ප්‍රශ්න **පහකට** පිළිතුරු සපයන්න.
* පළමුවන ප්‍රශ්නයට ලකුණු **20** ක් ද, තෝරා ගන්නා එක් ප්‍රශ්නයකට ලකුණු **10** බැගින් ද හිමි වේ.

1. (i) **ශුද්ධ** වූ පාවුලුතුමා විසින් යවන ලද ලිපි මගින් ඉටුකරන ලද සේවාවන් **දෙකක්** ලියා දක්වන්න.

(ii) **ශුද්ධ** වූ ජූසේ වාස් මුනිතුමාගේ දෙමාපියන්ගේ නම් ලියන්න.

(iii) සතරවන පනතට අනුව ප්‍රේමයෙන් දිවි **ෙවීම** සඳහා පවුලෙන් පිටත අය වෙනුවෙන් කළ හැකි දෑ **දෙකක්** දක්වන්න.

(iv) ඔබගේ ජීවිතය දෙවියන් වහන්සේට පිදෙන යාගයක් බවට පත්කර ගන්නා ආකාරය කෙසේ ද යන්න පෙන්වා දීමට උදාහරණ **දෙකක්** දක්වන්න.

(v) මය්‍යිාදාව හා **සම්බන්ධ** දේව පනත් **දෙක** ලියා දක්වන්න.

(vi) ශුද්ධ බයිබලය තුළ ඇති ගිවිසුම් සාමාන්‍ය සමාජයේ දක්නට ලැබෙන ගිවිසුම්වලට වඩා වෙනස් ය. එවැනි වෙනස්කම් **දෙකක්** ලියන්න.

(vii) ස්නාවක ජොහන්තුමා සෙබළුන්ට දුන් අවවාද **දෙකක්** ලියන්න.

(viii) "දෙවියන් වහන්සේව දකින" හා "දෙවියන් වහන්සේගේ පුත්‍රයෝ යැයි කියනු ලබන" යන පද ඇතුළත් භාග්‍ය **දෙක** සම්පූර්ණයෙන් ලියන්න.

(ix) ආශීර්වාදකාර බන්ධනයේ විවාහ පොරොන්දු තුළ ඇති පොරොන්දු **දෙකක්** ලියන්න.

(x) මරියතුමිය හා සම්බන්ධ මංගල්‍ය අතුරෙන් ණය මංගල්‍ය **දෙකක්** ලියා දක්වන්න.

2. (i) ජේසුස් වහන්සේගේ ස්වර්ගාරෝහණයෙන් පසු ශුද්ධාත්මයාණන් බලාපොරොත්තුවෙන් සිටි මරියතුමිය ඇතුළු ශ්‍රාවක පිරිස, ශුද්ධාත්ම දිනයේ දී අත්දුටු සිද්ධීන් **දෙකක්** ලියා දක්වන්න.

(ii) මුල් කිතුනු සභාවේ උපස්ථායකයින් පත්කිරීමේ දී සලකා බැලූ කරුණු **තුන** ලියා දක්වන්න.

(iii) ඔබේ ජීවිතයේ දී ශුද්ධාත්ම වරම් අත්දුටු අවස්ථා **පහක්** කෙටියෙන් විස්තර කරන්න.

3. (i) ධර්මදූත චාරිකාවල දී ශුද්ධ වූ පාවුලුතුමා මුහුණ දුන් බාධා **දෙකක්** නම් කරන්න.

(ii) ශුද්ධ වූ පාවුලුතුමාගේ දෙවන ධර්මදූත ගමනේ විවිධ අවස්ථාවල දී එතුමා සමග සම්බන්ධ වූ **තිදෙනා** නම් කරන්න.

(iii) සිසුවකු වශයෙන් ඔබේ පාසල තුළ දෙවියන් වහන්සේ සඳහා ඔබට කළ හැකි දෑ **පහක්** කෙටියෙන් විස්තර කරන්න.

4. (i) කතෝලික සභාවේ ධර්මෝපදේශය අනුව අපගේ ජීවිත කෙරෙහි ඇති වගකීම් **දෙකක්** ලියන්න.

(ii) දෙවියන් වහන්සේ, මනුෂ්‍යයා විසින් පාලනය කරනු ලැබීම සඳහා ඔහු යටතට පත්කළ සතුන් වර්ග **තුනක්** නම් කරන්න.

(iii) අන් අයගේ ජීවිත සුරැකීමට ඔබ කටයුතු කරන ආකාරය කරුණු **පහකින්** විස්තර කරන්න.

හයවැනි පිටුව බලන්න.

අ.පො.ස සාමාන්‍ය පෙළ සියලුම විෂය ධාරාවන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබාගැනීමට පිවිසෙන්න www.olevelapi.com වෙත ...

5. (i) පංච පුස්තකයෙහි සඳහන් පූජක සම්ප්‍රදායට අයත් සිද්ධි **දෙකක්** ලියන්න.

(ii) පංච පුස්තකයේ ඇති වැදගත්කම කරුණු **තුනකින්** ඉදිරිපත් කරන්න.

(iii) දේව වචනය ඔබේ ජීවිතයට ආලෝකයක් කරගන්නා ආකාරය කරුණු **පහකින්** පැහැදිලි කරන්න.

6. (i) ප්‍රසාද ස්නාපනය දානය කිරීමේදී 'ක්‍රිසම්' (Chrism) තෙලය ආලේප කිරීම මගින් කිතුනුවකු ශක්තිමත් කරනු ලබන්නේ කුමක් සඳහා දැයි කරුණු **දෙකකින්** ලියා දක්වන්න.

(ii) ප්‍රසාද ස්නාපනයෙන් ලැබෙන දේව වරප්‍රසාද **තුනක්** සඳහන් කරන්න.

(iii) ප්‍රසාද ස්නාපනය තුළින් ඔබ ලැබූ ත්‍රිවිධ කාර්යයන් ක්‍රියාවට නංවන ආකාර **පහක්** පැහැදිලි කරන්න.

7. පහත සඳහන් මාතෘකාවලින් **දෙකක්** තෝරාගෙන කෙටි සටහන් ලියන්න.

(i) දිව්‍ය සත්ප්‍රසාදීය ලක්ෂණයක් වන 'පරිස්මරණය'

(ii) ගරු මයිකල් රොද්‍රිගෝ පියතුමා

(iii) ඉශ්‍රායෙල් දිවැසිවරු

(iv) කතෝලික අපගේ දහම් පාසල

* * *

WWW.OLEVELAPI.COM

අ.පො.ස සාමාන්‍ය පෙළ සියලුම විෂය ධාරාවන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබාගැනීමට පිවිසෙන්න www.olevelapi.com වෙත ...